AL/2026/25 C/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

නූතන ලෝක ඉතිහාසය II (I කොටස)
நவீன உலக வரலாறு II (பகுதி I)
Modern World History II (Part I)

25 C | S | II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1989 දක්වා**

විභාග අංකය: ....................................

**උපදෙස්:**

- ※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- ※ **I කොටසෙහි 1- 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
- ※ **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- ※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 - 6 | |
| 2 | 7 - 16 | |
| 3 | 17 - 22 | |
| 4 | 23 - 27 | |
| 5 | 28 - 35 | |
| 6 | 36 - 40 | |
| **එකතුව** | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) ඒකදේවවාදය (2) ධනවාදය (3) ලිබරල්වාදය
(4) සමාජවාදය (5) අරාජකවාදය (......)

**2.** (1) සුන්ඩා (2) හෝමූස් (3) ජිබ්‍රෝල්ටා
(4) මැගලන් (5) පැනමා (......)

**3.** (1) ජෝන් වයික්ලිෆ් (2) ජෝන් හස් (3) ඉග්නේෂස් ලොයොලා
(4) මාටින් ලූතර් (5) ජෝන් කැල්වින් (......)

**4.** (1) වීනස්ගේ උපත (2) අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය
(3) මොනා ලිසා (4) මූඪත්වයේ අගය වැනීම
(5) අවසන් විනිශ්චය (......)

**5.** (1) මුගල් (2) සමුරායි (3) චිං
(4) කොන්බවුං (5) චක්‍රී (......)

**6.** (1) බොස්ටන් (2) ලෙක්සිංටන් (3) සරටෝගා
(4) පිලඩෙල්ෆියා (5) ක්විබෙක් (......)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



7. (1) ජෝන් කේ (2) ජේම්ස් හාග්‍රීව්ස් (3) රිචඩ් ආක්රයිට්
(4) චාල්ස් ටවුන්ෂෙන්ඩ් (5) සැමුවෙල් ක්‍රොම්ප්ටන් (......)

8. (1) කැලෝන් (2) මිරාබෝ (3) අබේ සියෙස්
(4) ලෆායට් (5) මරාට් (......)

9. (1) රාජේන්ද්‍ර ප්‍රසාද් (2) සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් (3) ලාල් බහදූර් ශාස්ත්‍රී
(4) වෙන්කත ගිරි (5) නීලම් සංජීව රෙඩ්ඩි (......)

10. (1) කේරළ (2) ත්‍රිවෙන්ද්‍රම් (3) හිමාචල් ප්‍රදේශ්
(4) තමිල්නාඩු (5) බටහිර බෙංගාලය (......)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද **එකිනෙකට නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) නේපාලය - හින්දු ආගම
(2) තායිලන්තය - බුද්ධාගම
(3) වියට්නාමය - තාඕවාදය
(4) පිලිපීනය - රෝමානු කතෝලික ආගම
(5) බංග්ලාදේශය - ඉස්ලාම් ආගම (......)

12. (1) ක්‍රෙම්ලින් - මොස්කව්
(2) ශාන්ත පීටර් දෙව්මැදුර - රෝමය
(3) වෙස්ට්මිනිස්ටර් - ලන්ඩන්
(4) ධවල මන්දිරය - වොෂිංටන්
(5) නිදහස් ප්‍රතිමාව - බර්ලින් (......)

13. (1) මහජන මන්ත්‍රී මණ්ඩලය - බ්‍රිතාන්‍යය
(2) ඩූමා - රුසියාව
(3) රයිෂ්ටාග් - ඉතාලිය
(4) ජාතික මහජන කොංග්‍රසය - මහජන චීන සමූහාණ්ඩුව
(5) ලෝක් සභා - ඉන්දියාව (......)

14. (1) ජෝන් ලොක් - ආණ්ඩුව පිළිබඳ රචනා දෙකක් (Two Treatises of Government)
(2) බැරන් ඩී මොන්ටෙස්කියු - නීතියේ සාරය (Spirit of the Laws)
(3) ජීන් ජැක් රූසෝ - සමාජ සම්මුතිය (Social Contract)
(4) ඇඩම් ස්මිත් - ජාතීන්ගේ ධනය (Wealth of Nations)
(5) ජවහර්ලාල් නේරු - අසිරිමත් ඉන්දියාව (The Wonder that was India) (......)

15. (1) ඉන්දුනීසියාව - සුන් යත්-සෙන්
(2) කියුබාව - ෆිදෙල් කස්ත්‍රෝ
(3) කොංගෝව - පැට්‍රිස් ලුමුම්බා
(4) සයිප්‍රස් - මකාරියොස්
(5) උගන්ඩාව - මිල්ටන් ඔබොටේ (......)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | යුප්‍රටීස් ගංගාව | A | - පාකිස්තානය |
| (ii) | නයිල් ගංගාව | B | - ඉරාකය |
| (iii) | සින්දු ගංගාව | C | - බ්‍රසීලය |
| (iv) | යැංට්සි ගංගාව | D | - ඊජිප්තුව |
| (v) | ඇමසන් ගංගාව | E | - චීනය |

(1) A C B E D (2) B D A C E (3) B D A E C (4) E C D B A (5) E D A C B (.........)

0788

| | X | | Y |
|---|---|---|---|
| **17.** | (i) අඳුරු මහාද්වීපය | A | - චීනය |
| | (ii) නව ලෝකය | B | - තුර්කිය |
| | (iii) නිදා සිටින යෝධයා | C | - අමෙරිකාව |
| | (iv) කිරීටයේ මාණික්‍යය | D | - අප්‍රිකාව |
| | (v) යුරෝපයේ රෝගියා | E | - ඉන්දියාව |

(1) D A B E C (2) D C A E B (3) D C A B E (4) E C D A B (5) E D B C A (.........)

| | X | | Y |
|---|---|---|---|
| **18.** | (i) දාහතරවන ලුවී | A | - 'නිදහස, සමානාත්මතාව, සහෝදරත්වය' |
| | (ii) අමෙරිකානු විප්ලවය | B | - 'විප්ලවය නම් මම වෙමි' |
| | (iii) ප්‍රංශ විප්ලවය | C | - 'නියෝජනය නැති නම් බදුත් නැත' |
| | (iv) නැපෝලියන් බොනපාට් | D | - 'සාමය, ඉඩම්, ආහාර' |
| | (v) බොල්ෂෙවික් විප්ලවය | E | - 'රාජ්‍යය නම් මම වෙමි' |

(1) C E A B D (2) D E A B C (3) D E B A C (4) E C A B D (5) E A C B D (.........)

| | X | | Y |
|---|---|---|---|
| **19.** | (i) වෙලෙස්ලි සාමි | A | - අස්වාමිකවාදය |
| | (ii) බෙන්ටින්ක් සාමි | B | - උපවාරක ගිවිසුම් ප්‍රතිපත්තිය |
| | (iii) ඩැල්හවුසි සාමි | C | - සති චාරිත්‍රය තහනම් කිරීම |
| | (iv) කැනිං සාමි | D | - බෙංගාලය දෙකඩ කිරීම |
| | (v) කර්සන් සාමි | E | - ඉන්දියාව බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීම |

(1) A C E B D (2) B C A E D (3) B C A D E (4) D B E C A (5) D E A B C (.........)

| | X | | Y |
|---|---|---|---|
| **20.** | (i) ඉන්දිරා ගාන්ධි | A | - ඉස්රායලයේ ප්‍රථම අගමැතිවරිය |
| | (ii) ගෝල්ඩා මෙයර් | B | - පාකිස්තානයේ ප්‍රථම අගමැතිවරිය |
| | (iii) ඉසබෙල් පෙරොන් | C | - ඉන්දියාවේ ප්‍රථම අගමැතිවරිය |
| | (iv) මාගරට් තැචර් | D | - ආර්ජන්ටිනාවේ ප්‍රථම ජනාධිපතිවරිය |
| | (v) බෙනාසීර් භුතෝ | E | - බ්‍රිතාන්‍යයේ ප්‍රථම අගමැතිවරිය |

(1) C A D E B (2) C E A B D (3) D E B A C (4) E D A B C (5) E D A C B (.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

PAST PAPERS WIKI

**21. අමෙරිකානු විප්ලවය**

(1) ප්‍රධාන හේතුවක් වූයේ බ්‍රිතාන්‍ය යටත්විජිත ප්‍රතිපත්තියට එරෙහිව අමෙරිකානු ජනපද තුළ පැවති අප්‍රසාදය යි.
(2) අමෙරිකානු විප්ලවයේ චින්තනය කෙරෙහි වොල්ටෙයාර්ගේ අදහස් බලපෑවේ ය.
(3) බොස්ටන් තේ සාදය තීරණාත්මක සිදුවීමකි.
(4) ජෝර්ජ් වොෂිංටන් විසින් මෙහෙයවන ලදී.
(5) අමෙරිකානු විප්ලවය, ප්‍රංශ විප්ලවයේ නායකයන් කෙරෙහි බලපෑවේ ය. (.........)

**22. කාර්මික විප්ලවය**

(1) කාර්මික විප්ලවය, ග්‍රාමීය ආර්ථිකයක සිට නාගරික ආර්ථිකයකට බ්‍රිතාන්‍ය ආර්ථිකය පරිවර්තනය කළේය.
(2) කර්මාන්තශාලා ක්‍රමය නිමි භාණ්ඩ නිෂ්පාදනය වර්ධනය කළේ ය.
(3) මුද්‍රණ යන්ත්‍රය, කාර්මික විප්ලව සමයේ කෙරුණු ප්‍රධාන නවෝත්පාදනයකි.
(4) කාර්මික විප්ලව සමයේ දී රෙදිපිළි කර්මාන්තය විශාල වශයෙන් වර්ධනය විය.
(5) විශාල කාර්මික නගර වර්ධනයවීමට කාර්මික විප්ලවය මඟ පෑදී ය. (.........)

Past Papers Wiki



**23.** **ප්‍රංශ විප්ලවය**

(1) පහළොස්වන ලුවී රජුගේ රාජ්‍ය සමයේ පැන නැගුණි.
(2) එස්ටේට්ස් ජෙනරාල් සභාව කැඳවීම
(3) ටෙනිස් පිටියේ දිවුරුම
(4) බැස්ටීලය බිඳදැමීම
(5) බූර්බොන් රාජවංශය නෙරපා දැමීම (.........)

**24.** **ඉන්දියානු ජාතික සටන**

(1) 1857 දී බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව සිපෝයි කැරැල්ල ඇති විය.
(2) ඉන්දියානු ජාතික සංගමය 1885 දී පිහිටුවනු ලැබී ය.
(3) සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය ජවහර්ලාල් නේරුගේ නායකත්වය යටතේ දියත් කෙරිණි.
(4) 'ඉන්දියාවෙන් පිටවෙනු' ව්‍යාපාරය 1942 දී ආරම්භ විය.
(5) ඉන්දියාව 1947 දී නිදහස අත්පත් කර ගත්තේ ය. (.........)

**25.** **නිරවි යුද සමයේ මතු වූ අර්බුද**

(1) මොරොක්කෝ අර්බුදය
(2) බර්ලිනය අවහිර කිරීම
(3) කොරියන් යුද්ධය
(4) කියුබානු මිසයිල අර්බුදය
(5) වියට්නාම් යුද්ධය (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ............ **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** පුනරුදය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ඉතාලියේ ආරම්භ විය.
(B) 1453 දී තුර්කීන් කොන්ස්තන්තිනෝපලය යටත් කරගැනීම පුනරුදයට හේතුවක් සේ සලකනු ලැබේ.
(C) පුනරුද සමයේ ගොතික් කලාව වර්ධනය විය.
(D) පුනරුදය, ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රතිඵලයකි. (.........)

**27.** සියම (තායිලන්තය) සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) පෘතුගීසි ප්‍රතිරාජ අල්ෆොන්සෝ ද අල්බකර්ක් 1511 දී සියම ආක්‍රමණය කළේ ය.
(B) න්ගුයෙන් රාජවංශය විසින් සියම පාලනය කරනු ලැබීය.
(C) සියම කිසිදිනෙක බටහිර බලවතෙකුගේ යටත්විජිතයක් බවට පත්වූයේ නැත.
(D) 19 වන සියවස අග හා 20 වන සියවස මුල සියම් පාලකයෝ නවීකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළහ. (.........)

**28.** ඉන්දුනීසියාවේ ලන්දේසි පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ලන්දේසීහු දහසය වන සියවස ආරම්භයේ දී ඉන්දුනීසියාවට පැමිණිය හ.
(B) දාහත්වන සියවස අග වනවිට ලන්දේසී පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම, ඉන්දුනීසියානු දූපත්වලින් බහුතරයක බලය අත්පත් කරගත්තේ ය.
(C) ලන්දේසීහු සිය මූලස්ථානය බතාවියේ පිහිටවූ හ.
(D) දහඅටවන සියවස අගවන විට පෘතුගීසීන් විසින් ලන්දේසි බල ප්‍රදේශ යටත් කරගනු ලැබිය. (.........)

**29.** සෝවියට් දේශය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) 1917 විප්ලවයෙන් පසුව සෝවියට් දේශය කොමියුනිස්ට් රාජ්‍යයක් ලෙස නිර්මාණය කෙරිණි.
(B) වී. අයි. ලෙනින් ප්‍රථම රාජ්‍ය නායකයා විය.
(C) බටහිර සමග 'සාමකාමී සහජීවනය' අත්‍යවශ්‍ය යැයි නිකිතා කෘෂ්චෙෆ් ප්‍රකාශ කළේ ය.
(D) මිහායිල් ගොර්බචොෆ් සෝවියට් දේශයේ අවසන් නායකයා විය. (.........)

**30.** දෙවන ලෝක යුද්ධය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) හිට්ලර්ගේ පෝලන්ත ආක්‍රමණය දෙවන ලෝක යුද්ධය ඇතිවීමට ආසන්නතම හේතුව විය.
(B) යුද්ධය ආරම්භයේ දී බ්‍රිතාන්‍යය මධ්‍යස්ථ පාර්ශවයක් වශයෙන් සිටීමට උත්සාහ කළේ ය.
(C) දෙවන ලෝක යුද්ධය අක්ෂ බලවතුන් හා මිත්‍ර බලවතුන් අතර හටගැනිණි.
(D) දෙවන ලෝක යුද්ධය අවසානයේ වර්සායි ගිවිසුමට අත්සන් තබන ලදී. (.........)

- අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයක ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** රුධිර සංසරණ පද්ධතිය සොයාගත්තේ කවුද?
(1) ජොහැන්නස් කෙප්ලර් (2) අයිසැක් නිව්ටන් (3) විලියම් හාවේ
(4) චාල්ස් ඩාවින් (5) ඇල්බට් අයින්ස්ටයින් (.........)

**32.** ශාන්තිනිකේතන් පිහිටුවන ලද්දේ කවුරුන් විසින් ද?
(1) රාම් මෝහන් රෝයි (2) ස්වාමි විවේකානන්ද (3) දයානන්ද සරස්වතී
(4) දේවේන්ද්‍රනාත් තගෝර් (5) ක්‍රිෂ්ණ මෙනන් (.........)

**33.** 1911 දී ජනරජයක් පිහිටුවීමෙන් අනතුරුව චීනයේ ජනාධිපති ලෙස පත්වූයේ කවුරුන් ද?
(1) කාං යූ-වෙයි (2) යුවාං ෂි-කායි (3) චියෑං කායි-ෂෙක්
(4) චෞ එන්-ලායි (5) ඩෙං ෂියාඕ-පිං (.........)

**34.** ජපානය කොන්දේසි විරහිතව අමෙරිකානු හමුදාවට යටත් වූ සමයේ ජපන් අධිරාජයා කවුද?
(1) අයාහිතෝ (2) ඔසාහිතෝ (3) හිරොහිතෝ
(4) මුට්සුහිතෝ (5) යොෂිහිතෝ (.........)

**35.** ඉන්දියාවේ අවසන් බ්‍රිතාන්‍ය ප්‍රතිරාජයා කවුද?
(1) ඇම්හර්ස්ට් සාමි (2) මින්ටෝ සාමි (3) අර්වින් සාමි
(4) වැවෙල් සාමි (5) මවුන්ට්බැටන් සාමි (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | 'මිනිසාගේ හා පුරවැසියාගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය' ජීන් ජැක් රූසෝගේ කෘතියකි. | ප්‍රංශ විප්ලව සමයේ දී දහසය වන ලුවී රජුට සහ ඔහුගේ බිසවට මරණ දඬුවම පමුණුවන ලදී. | (.........) |
| **37.** | බිස්මාක්ගේ ප්‍රතිපත්තිය, 'තත්කාලීන වැදගත් ප්‍රශ්න විසඳනු ලබන්නේ කතා පැවැත්වීමෙන් හෝ බහුතරයේ ඡන්දයෙන් නොව ලෙයින් හා යකඩෙනි' යන ඔහුගේ ප්‍රසිද්ධ ප්‍රකාශය තුළ ගොනුකොට ඇත. | බිස්මාක්ගේ දක්ෂ නායකත්වය යටතේ ඉතාලිය එක්සත් කෙරිණි. | (.........) |
| **38.** | දහනව වන සියවස දෙවන අර්ධයේ දී ප්‍රංශ ජාතිකයෝ ඉන්දු-චීනය තුළ සිය යටත්විජිත අධිරාජ්‍යය පිහිටවූහ. | ඉන්දු-චීන යුද්ධයේ අවසානය උදා කළා වූ 1954 ජිනීවා සම්මේලනය හේතු කොටගෙන වියට්නාමය, උතුරු හා දකුණු වශයෙන් රාජ්‍ය දෙකකට බෙදිණි. | (.........) |
| **39.** | 1947 දී අමෙරිකානුවන් විසින් බටහිර පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රමිතීන්ට අනුකූලවූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ජපානයේ ක්‍රියාත්මක කරන ලදී. | 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජපන් අධිරාජ තනතුර ව්‍යවස්ථාපිත රාජත්වයක් වශයෙන් වෙනස්කොට, ද්විමණ්ඩල ඩයට් සභාවකට ව්‍යවස්ථාදායක බලතල පවරන ලද අතර අගමැතිවරයෙකු ප්‍රධානත්වය දරන්නා වූ හා ඩයට් සභාවට වගකිව යුතු වූ කැබිනට් මණ්ඩලයකට විධායක බලතල පවරන ලදී. | (.........) |
| **40.** | බ්‍රෙෂ්නෙෆ්ගේ ප්‍රතිපත්ති නිරවි යුද්ධයේ 'ලිහිල්වීමකට' හේතු වූ බව විශ්වාස කෙරේ. | සෝවියට් දේශය බිඳවැටීමෙන් පසුව උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය විසුරුවා හැරිණි. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | | |
|---|---|---|---|
| නූතන ලෝක ඉතිහාසය<br>நவீன உலக வரலாறு<br>Modern World History | II<br>II<br>II | 25 C | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 1

විභාග අංකය / சுட்டெண் / Index No. } ..............................



Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

නූතන ලෝක ඉතිහාසය II (II කොටස)
நவீன உலக வரலாறு II (பகுதி II)
Modern World History II (Part II)

25 C | S | II

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**

- ※ පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- ※ **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- ※ **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ※ **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) හ්වැං හෝ ගංගාව (ii) මලක්කා සමුද්‍ර සන්ධිය (iii) රතු මුහුද
(iv) බ්‍රසීලය (v) සුභපැත්මේ තුඩුව (vi) බොම්බාය
(vii) වොෂිංටන් (viii) ඉරානය (ix) වියට්නාමය
(x) ලෙනින්ග්‍රෑඩ් (xi) තායිවානය (xii) කියුබාව

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්)*

## B කොටස

**2.** "පහළොස්වන හා දහසයවන සියවස්වල ඇති වූ දේශගවේෂණ, යුරෝපයේ පමණක් නොව ලොව අන් බොහෝ ප්‍රදේශවල ද දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයන්හි ප්‍රබල වෙනස්කම් ඇති කළේ ය."

(i) පහළොස්වන සියවස අග වන විට දේශගවේෂණ ආරම්භ කරන ලද අයිබීරියානු රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) දේශගවේෂණ සඳහා අනුග්‍රහ දක්වන ලද අයිබීරියානු රටවල පාලකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) දේශගවේෂණවල ප්‍රධාන අරමුණු සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) යුරෝපය හා ලොව අන් ප්‍රදේශ කෙරෙහි දේශගවේෂණවල බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

**3.** (i) 1688-1689 ඉංග්‍රීසි විප්ලවය ඇතිවීමට තුඩු දුන් පසුබිම විග්‍රහ කරන්න. (ලකුණු 10 යි)

(ii) එම විප්ලවයේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 06 යි)

**4.** පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 16 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) පුනරුද අවධියේ කලාව
(ii) ප්‍රංශ ජාතික රාජ්‍යයේ නැගීම
(iii) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල
(iv) ෆ්‍රැන්ක්ෆර්ට් පාර්ලිමේන්තුව

(ලකුණු 08 × 2 = 16 යි)

[අවසැනි පිටුව බලන්න.

PAST PAPERS WIKI

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## C කොටස

6. "මෙයිජි යුගය වූ කලී ජපානය නූතන රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීමට තුඩු දුන් සීඝ්‍ර වෙනස්වීම් ඇති කරන ලද අවධිය යි."

   (i) මෙයිජි යුගයට පෙර යුගය නම් කරන්න. (ලකුණු 01 යි)

   (ii) පූර්ව-මෙයිජි අවධියේ දී අධිරාජයාගේ නාමයෙන් රට පාලනය කිරීමේ වගකීම දැරූ නිලධාරියා නම් කරන්න. (ලකුණු 01 යි)

   (iii) 'මෙයිජි ප්‍රතිෂ්ඨාපනය' යන්නෙන් කුමක් අදහස් වේදැ යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

   (iv) මෙයිජි යුගයේ දී ඇති වූ දේශපාලන හා ආර්ථික වෙනස්වීම් විග්‍රහ කරන්න. (ලකුණු 12 යි)

7. දෙවන ලෝක යුද්ධයේ කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල විචාරාත්මකව විමසන්න. (ලකුණු 16 යි)

8. (i) මාඕ සේතුං විසින් මහජන චීන සමූහාණ්ඩුව තුළ ක්‍රියාත්මක කරන ලද දේශපාලන, සමාජ හා ආර්ථික ප්‍රතිපත්ති පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

   (ii) එම ප්‍රතිපත්ති කෙතෙක් දුරට සාර්ථක වී දැයි ප්‍රමාණ කරන්න. (ලකුණු 06 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   (i) ඉතාලියේ ෆැසිස්ට්වාදය

   (ii) හෝ චි මිං

   (iii) ඉන්දුනීසියාවේ ජාතික ව්‍යාපාරය

   (iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය (ලකුණු 08 × 2 = 16 යි)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library